&Ú ´ { ÚÆæ à` Ú
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

# ප්‍රායෝගික තාක්ෂණ කුසලතා

9 ශ්‍රේණිය | කාලය පැය 2 යි.

නම/ විභාග අංකයඃ

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 10 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01 විකර්ෂක බෝගයකි,

(1) සූරියකාන්ත (2) ඉද්ද (3) රෝස (4) පිච්ච

02 ශාකවලින් සිදුවන කාර්යයක් නොවන්නේ,

(1) රසායනික ද්‍රව්‍ය සැපයීම.

(2) අන්තර් මෝසම් වැස්ස ලබාදීම.

(3) වායුගෝලයට මීතේන් ලබාදීම.

(4) සුළං කුණාටුවලට බාධකයක් ලෙස ක්‍රියා කිරීම.

03 පස සරුකිරීමට යොදාගත හැකි ශාක වර්ගයකි,

(1) කොස් (2) සබුක්කු (3) පොල් (4) ලේන්තැරි

04 ඖෂධ සඳහා වවන ශාක වර්ගයකි,

(1) කැකුණ (2) ගම්මාළු (3) තේක්ක (4) පිහිඹියා

05 මාෂ බෝග කාණ්ඩයට අයත්වන්නේ,

(1) මාළු (2) මස් (3) කඩල (4) බීට්

06 අසාත්මිකතාවය යනු,

(1) මදුරුවන්ගෙන් ඇතිවන රෝගයකි. (2) මැස්සන්ගෙන් ඇතිවන රෝගයකි.

(3) ආහාර මගින් ඇතිවන රෝගයකි. (4) පණු රෝගයකි.

07 අලිපේර, ස්ට්‍රෝබෙරි, අර්තාපල් වැනි ආහාර වැඩිවශයෙන් වගාකර ඇත්තේ,

(1) ඌව පළාතේ (2) නැගෙනහිර පළාතේ

(3) වයඹ පළාතේ (4) මධ්‍යම පළාතේ

08 ලැක්ටොබැසිලස් යනු,

(1) කිරි මිදවීමට ක්‍රියාකරන බැක්ටීරියාවකි.

(2) ආහාර නරක්වීමට උදව් කරන බැක්ටීරියාවකි.

(3) ආහාර දිරවීමට උදව් වන බැක්ටීරියාවකි.

(4) ආහාර කල්තබා ගැනීමට උදව් වන බැක්ටීරියාවකි.

09 ලේබලයක තිබිය යුතු කරුණක් නොවන්නේ,

(1) ප්‍රවාහනය කළ යුතු ආකාරය

(2) භාණ්ඩය පරිභෝජනය කරන ආකාරය

(3) නිෂ්පාදිතය ගබඩා කරන ආකාරය

(4) ප්‍රමිතියට අනුකූල නොවීම

10 කාලය, ශ්‍රමය පිරිමැසීමේ උපකරණයකි,

(1) පීඩන උඳුන (2) පිහිය (3) කතුර (4) කේතලය

(1 x 10 = 10)

- **හිස් තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

(මූල්‍යමය උපකාරයක් / ප්‍රවර්ධනය / වර්ධක ආහාර / ජීව වායු ඒකකයකින් / ආරක්ෂක ආහාර / විජලනය)

11 වෙළඳපළට ඉදිරිපත් කරන භාණ්ඩයක අලෙවිය තවදුරටත් වර්ධනය කර ගැනීම ............................................................... ලෙස හැඳින්වේ.

12 යම් ....................................................... ලබාගැනීම සඳහා සණස බැංකුව වැනි ආයතනයකට යා යුතුය.

13 පාචනයෙන් පසු දැකිය හැකි රෝග ලක්ෂණයක් ලෙස ................................................. හැඳින්විය හැක.

14 මස්, මාළු ආදිය ....................................... වන අතර, පලතුරු, එළවළු ................................. ගණයට ගැනේ.

15 ඉන්ධන ලෙස දැව භාවිතය අඩුකිරීම ....................................................... ඇති වාසියක් වේ.

(2 x 5 = 10)

## II කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

01 (1) කාර්යක්ෂමතාව සඳහා භාවිතා කරන උපකරණවල කාර්යක්ෂමතාවය වැඩිකර ගත හැකි ක්‍රම 2 ක් ලියන්න.

(2) ගෑස් ලිපක රූප සටහනක් ඇඳ එහි ප්‍රධාන කොටස් 3 නම් කරන්න.

(3) ගෑස් ලිප සඳහා භාවිතා කරන වායුව නම් කරන්න.

02 (1) ආහාර පිරමීඩයක් ඇඳ ප්‍රධාන කොටස් 5 නම් කරන්න.

(2) අප ගන්නා ආහාරවලින් ලැබෙන ප්‍රයෝජන අනුව බෙදෙන ප්‍රධාන කොටස් 3 නම් කර, ඒ සඳහා අදාළ ආහාර 3 බැගින් ලියන්න.

(3) වයස අවුරුදු 15 ක ගැහැනු ළමයෙකු සඳහා දිවා ආහාර වේලක බොජුන්පත සකසා එම බොජුන් පතේ අඩංගු පෝෂක වෙන වෙනම ලියන්න.

03 (1) ව්‍යාපාරයක් යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(2) ව්‍යාපාර සැලැස්ම යනු කුමක් ද? ඒ සඳහා ඇතුළත් විය යුතු කරුණු 5 ලියන්න.

(3) ව්‍යාපාර දිරිගැන්වීම යනු කුමක් ද? එය බෙදෙන ප්‍රධාන කොටස් නම් කර උදාහරණ 2 බැගින් ලියන්න.

(3 x 10 = 30)

- ඉතිරි ලකුණු ප්‍රමාණය ප්‍රායෝගික ක්‍රියාකාරකම මත පදනම් වේ.